(04)


# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
# நலன்புரி நன்மைகள் சபை
# WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | WBB/02/Notice/D/Div.s/20 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2024.02.16 |

WBB/Circular/No -03/2024

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්/
නියෝජ්‍ය සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් වෙත

**ජාතික හැඳුනුම්පත් නොමැතිව අස්වැසුම බැංකු ගිණුම් විවෘත කර ඇති ප්‍රතිලාභීන් ගේ ගැටළුවට විසඳුම් ලබා දීම**

01. ජාතික හැඳුනුම්පත් නොමැති අස්වැසුම සුදුසුකම්ලාභීන් හට ජාතික හැඳුනුම්පතක් මාස 6ක් ඇතුළත ලබා ගෙන ඉදිරිපත් කිරීමේ කොන්දේසියට යටත්ව ලංකා බැංකුවේ, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ගිණුම් විවෘත කිරීම සඳහා අවස්ථාව ලබාදී තිබුණි. එම කාලය පසුව තව දුරටත් මාස දෙකකින් දීර්ඝ කරන ලදි. එම කාලයද අවසන් වීමට නියමිත බැවින් පහත සඳහන් විකල්ප ක්‍රියාමාර්ග ගැනීම තුළින් මෙම ගැටළු විසඳීමට පිවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

   I. දැනටමත් ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා අයදුම්කර ඇති මෙවැනි පුද්ගලයින්ගේ ලැයිස්තුවක් සකස් කර පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් වෙත යොමු කර ප්‍රමුඛතා පදනමකින් හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා යොමු කිරීම පිණිස මා වෙත එවන්න.

   II. මෙතෙක් ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා අයදුම්කර නැති ප්‍රතිලාභීන්ගේ තොරතුරු ලැයිස්තුවක් ග්‍රාම නිලධාරින්ගේ මට්ටමින් ලබාගෙන දැනට ජාතික හැඳුනුම්පතක් නොමැතිව විවෘත කර ඇති බැංකු ගිණුම් අක්‍රිය කරවා ගෙන ඒ වෙනුවට ප්‍රතිලාභීන්ගේ පවුලේ වෙනත් වැඩිහිටි සාමාජිකයෙකු නමින් නව අස්වැසුම බැංකු ගිණුමක් විවෘත කරවීම. මේ සඳහා අයදුම්කාර ප්‍රතිලාභීන්ගේ කැමැත්ත ලබාගත යුතුයි. ඒ සඳහා ඇමුණුම 1හි දක්වා ඇති ආකෘතිය අනුව ලිපියක් පරිගණක පද්ධතිය තුළින් ජනනය කරගෙන එය සම්පූර්ණ කර ප්‍රාදේශීය ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් වෙනුවට සහකාර ප්‍රාදේශීය ලේකම් අත්සන් කර එම බැංකුව වෙතට යොමු කරන්න. පසුව අදාළ බැංකුව වෙතින් බැංකු ගිණුම් විස්තර ගෙන්වා ගෙන එම විස්තර පරිගනක පද්ධතිය තුළ යාවත්කාලීන කිරීමට පියවර ගන්න.

02. මෙතෙක් බැංකු ගිණුම් විවෘත කර නැති අස්වැසුම ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් බැංකු ගිණුම් විවෘත කිරීමේදී ද අයදුම්කරුට ජාතික හැඳුනුම්පතක් නොමැති නම් ඔහු හෝ ඇය වෙනුවට පවුලේ වෙනත් වැඩිහිටි සාමාජිකයෙකු නමින් බැංකු ගිණුමක් විවෘත කරවීම සඳහා ඇමුණුම I ආකෘතිය භාවිතා කරමින් ලිපියක් ප්‍රාදේශීය ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් වෙනුවට සහකාර ප්‍රාදේශීය ලේකම් අත්සන් කර නිකුත් කළ හැකියි.


කාර්යාලය } Tel: 009411-2151481 විද්‍යුත් තැපැල } welfarebenefitboard2016@gmail.com වෙබ් අඩවිය }



Scanned with CamScanner

03. මෙසේ බැංකු ගිණුම් විවෘත කිරීම සඳහා ලිපි නිකුත් කිරීමේදී පරිගනක පද්ධතිය තුළ අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය ඇමුණුම් II වශයෙන් දක්වා ඇත.

04. බැංකු ගිණුම් විස්තර අදාළ බැංකුව වෙතින් ලබාගෙන පරිගණක පද්ධතිය තුළ යාවත්කාලීන කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය ඇමුණුම් III වශයෙන් දක්වා ඇත.

05. ඉහත ක්‍රියා මාර්ගය අනුගමනය කරමින් ජාතික හැඳුනුම්පත් නොමැති අස්වැසුම ප්‍රතිලාභින්ගේ ගැටළුව සැලසුම් සහගත ප්‍රවේශයකින් කඩිනමින් විසඳීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

ජයන්ත විජේරත්න
සභාපති/කොමසාරිස්

පිටපත් -

ලේකම්, රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
කොමසාරිස් ජනරාල්, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/අතිරේක සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන්
} අවශ්‍ය සම්බන්ධීකරණ සහාය සඳහා

Scanned with CamScanner